## 27 වන ලෝක දේශගුණික සමුළුවෙහි දකුණු ආසියාවේ පරිසර අමාත්‍යවරුන්ගේ රැස්වීම:

### පරිසර අමාත්‍ය නසීර් අහමඩ්, දේශසීමා අතර පරිසර දූෂණය අවම කිරීම සඳහා පුළුල් සහයෝගීතාවයක් දකුණු ආසියාවේ සගයන්ගෙන් ඉල්ලා සිටී.

“පරිසර හායනය වැනි දකුණු ආසියාවේ ප්‍රධාන ගැටලු උග්‍ර වීමට කලාපයේ රටවල් අතර පවතින දේශපාලන අවිශ්වාසය, යම් පමනකින් දායක වී ඇත. සාර්ක් දේශපාලන ක්‍රියාවලිය දුර්වල මොහොතක, දකුණු ආසියාවේ පවතින පාරිසරික ගැටලු විසඳීමට සහ අවම කිරීමට කටයුතු කළ හැකි වඩාත් කාර්යක්ෂම සහ ප්‍රගතිශීලී සහයෝගීතා මාර්ග සැකසීම සඳහා පුළුල් සහයෝගීතාවක් ඇති කිරීමට නව සහ විකල්ප වේදිකා ගවේෂණය කළ යුතුය." මෙම නොවැම්බර් 07 සිට 18 දක්වා ඊජිප්තුවේ ෂර්ම් එල් ෂෙයික් හි පැවති 27 වන ලෝක දේශගුණික සමුළුවට සමගාමීව, දකුණු ආසියාතික රටවල පරිසර අමාත්‍යවරුන්ගේ රැස්වීමක් අමතමින් මෙම අදහස් පළ කළේය.

අමාත්‍ය අහමඩ් වැඩිදුරටත් පැවසුවේ, “ප්‍රමාද වීමට පෙර, පාරිසරික සහයෝගීතාව සඳහා අපගේ උපරිම කැපවීම යථාර්ථයන් කිරීමට කටයුතු කරමු. කලාපීය දේශගුණික ව්‍යසනයන් කොතැනක සිදු වුවද ඒ පිළිබඳව එකම හඬක් සහ අන්‍යොන්‍ය හැඟීමක් වර්ධනය කරමු. පාරිසරික විපත් අවම කිරීම සහ අනුවර්තනය කිරීම පිළිබඳ අපගේ දැනුම සහ හොඳම භාවිතයන් බෙදා ගනිමු.

කොළඹ මුලස්ථානය කරගත් දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහන (SACEP) විසින් සංවිධානය කරන ලද මෙම රැස්වීම "දකුණු ආසියාවට එක් හඬක්" යන තේමාව යටතේ සාකච්ඡා සිදු කිරීම සඳහා පරිසර, වන විද්‍යා සහ දේශගුණික කටයුතු සඳහා වගකිව යුතු අමාත්‍යවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එක් කර ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ අද්විතීය පරිසරය සහ දේශගුණය ගැන සඳහන් කරමින් අමාත්‍ය අහමඩ් ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවට එහි අත්‍යවශ්‍ය දේශසීමා ඉක්මවීමේ පහත සඳහන් ස්වභාවය හේතුවෙන්, පරිසර දූෂණය පිලිබඳ අර්බුදය තනිවම විසඳීමට නොහැකි බවයි;

- අසල්වැසි රටවල වායු විමෝචනය මගින් ශ්‍රී ලංකාවේ වාතය දූෂණය වන අතර එමඟින් වාතයේ ගුණාත්මක භාවය අඩු වේ
- සාගර පරිසර පද්ධති සහ කොරල්පර විනාශ කරන ප්ලාස්ටික් නිෂ්පාදන සහ සමුද්‍ර අපද්‍රව්‍ය දේශසීමා ඉක්මවා ඒමේ ගැටලුවට රට මුහුණ දී සිටී.
- නීති විරෝධී ලෙස මසුන් දඩයම් කිරීම හේතුවෙන් මත්ස්‍ය ගහනය, ජෛව විවිධත්වය, සහ වාසස්ථාන විනාශ වෙමින් පවතී.
- එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍ර ව්‍යසනය වැනි ව්‍යසනයන් නිසා සිදුවන පරිසර දූෂණ අනාගතයේ දී නව කලාපීය නියාමන රාමු මඟින් වැළැක්විය යුතුය. එම සන්දර්භය තුළ, විශේෂයෙන් ශ්‍රී ලංකාව මුහුණ දෙන ආකාරයේ, දේශසීමා ඉක්මවීමේ ස්වභාවයේ පාරිසරික ගැටළු විසඳීම සඳහා වඩාත් කලාපීය ප්‍රවේශයක් කරා දකුණු ආසියානු රටවල් මෙහෙයවන ලෙස අමාත්‍ය අහමඩ් දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහනෙන් ඉල්ලා සිටියේය.
- දකුණු ආසියානු කලාපයේ දේශසීමාන්තර වායු දූෂණය වැළැක්වීම සඳහා නීත්‍යානුකූල බැඳීම් ඇති ක්‍රමවේද හඳුන්වා දීම
- ප්ලාස්ටික් දූෂණය සහ සමුද්‍ර අපද්‍රව්‍ය පිළිබඳ බැඳීම් ඇති ක්‍රමවේද හඳුන්වා දීම
- ඉන්දියානු සාගරය නියාමනය කිරීම සහ දකුණු ආසියානු කලාපයේ සාගර සම්පත් කළමනාකරණය සඳහා කලාපීය රාමු සකස් කිරීම

- කලාපීය සහයෝගිතා වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීම
- අනෙකුත් කලාපීය/ගෝලීය නියෝජිතායතන සහ දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහනේ සාමාජික රටවල් සමඟ කලාපීය සහයෝගිතා පරිසර වැඩසටහන් සංවර්ධනය කිරීම
- දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය, ඉඩම් ප්‍රතිසංස්කරණය සහ සමුද්‍ර අංශය වැනි පාරිසරික ක්ෂේත්‍රවල උතුරු-දකුණු, දකුණ-දකුණු සහ ත්‍රිකෝණාකාර සහයෝගීතාව ශක්තිමත් කිරීම.

දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහනේ අනෙකුත් සාමාජික රටවල් නියෝජනය කළේ සෙනෙට් සභික ෂෙරී රෙහ්මාන්, පකිස්ථානයේ දේශගුණික විපර්යාස අමාත්‍ය ගරු උමා රෙග්මි, නේපාලයේ කාන්තා, ළමා සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ අමාත්‍ය, බංග්ලාදේශයේ පරිසර අමාත්‍ය ගරු මොහොමඩ් ෂහාබ් උද්දින්, පාර්ලිමේන්තු මන්ත්‍රී හබිබුන් නහාර්, බංග්ලාදේශයේ නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය ෆර්හිනා අහමඩ්, බංගලාදේශයේ පරිසර වන හා දේශගුණික විපර්යාස අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පෙම් නාරායන් කෙන්ඩල්, නේපාලයේ පරිසර ලේකම්, භූතානයේ නියෝජිත සෝනම් මහතා, ඉන්දියා නියෝජිත නිතේෂ් කුමාර් මහතා, මාලදිවයිනේ දේශගුණ විපර්යාස අධ්‍යක්ෂ, ඩොනල්ඩ් කූපර් මහතා සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් රැස්වීමට සහභාගී වූහ.




පරිසර අමාත්‍ය නසීර් අහමඩ් (මැද) අනෙකුත් දකුණු ආසියාතික රටවල අමාත්‍ය නියෝජිතයන් සමඟ.

## දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහන (SACEP)

දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහන (SACEP) යනු කලාපයේ පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ සහාය වීම සඳහා දකුණු ආසියාවේ රජයන් විසින් 1982 දී පිහිටුවන ලද අන්තර් රාජ්‍ය සංවිධානයකි. දකුණු ආසියා පරිසර සහයෝගිතා වැඩසටහනේ සාමාජික රටවල් වන්නේ ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාවයි.